# වියුක්තය හා ආකිමිඩීස්

සිංහල භාෂාවේ වියුක්තිය ප්‍රකාශ කිරීමේ දී කලින් සඳහන් කරන ලද ගැටළු තිබීමෙන් පෙන්නුම් කරන්නේ සිංහලයන් වියුක්ත චින්තනයෙහි එතරම් දක්ෂයන් නොවන බව ය. අප සිතන අයුරින් සිංහලයන් පමණක් නොව අනාර්ය (ද්‍රවිඩ නොවන - අනාර්ය  යනු ද්‍රවිඩ නොවන බව පුන පුනා ප්‍රකාශ කිරීමට සිදු වී ඇත්තේ සමාජයේ විශේෂයෙන් ම ලංකාවේ හා ඉන්දියාවේ අනාර්ය යනු ද්‍රවිඩ බවට මතයක් ඇති වී තිබෙන බැවින් ය. අප අනාර්ය යනුවෙන් හඳුන්වන්නේ අර්යයන් දඹදිවට පැමිණ එය භාරතය බවට පත්කිරීමට පෙර එහි සිටි ජනතාව ය.) ඇතුළු ආසියාතික ජනයා ද අප්‍රිකානු ජනයා ද වියුක්ත චින්තනයෙහි එතරම් දක්ෂයෝ නො වෙති.

ආර්යයෝ, එනම් වයඹ දෙසින් දඹදිවට පැමිණි ජනතාව අනාර්යයන්ට වඩා වියුක්ත චින්තනයෙහි ලා දක්ෂයෝ වූහ. අනාර්යයන් යුද්ධයෙන් හා උපක්‍රමයෙන් පරාජය කර තම ආධිපත්‍යය පිහිටුවීමට ආර්යයන්ට වියුක්ත චින්තනය ආධාර වුවාට සැකයක් තිබිය නො හැකි ය. වියුක්ත චින්තනයෙහි එක් ලක්ෂණයක් වනුයේ ප්‍රවාද නිර්මාණයෙහි ලා එහි දායකත්වය ය. එමෙන් ම වියුක්ත චින්තනය ඔස්සේ පුරෝකථනය ද පහසු වෙයි. දඹදිවට පැමිණි ආර්යයන්ට අනාර්යයන් පරාජය කර භාරතයක් බිහිකිරීමටත් පසු කලෙක බුදුන් වහන්සේට හා බුදු දහමට ටික කලක් පරාජය වී සිටිය ද නැවතත් අනාර්ය දර්ශන පරාජය කර වෛදික දහම ප්‍රචලිත කිරීමටත් හැකිවූයේ ප්‍රධාන වශයෙන් ම ඔවුන් වියුක්ත චින්තනයෙහි දක්ෂයන් වූ බැවින් යැයි සිතිය හැකි ය.

වෛදිකයෝ පසු කලෙක භාරතීය ගණිතයක් ද නිර්මාණය කළහ. එහි යම් වියුක්තියක් විය. එහෙත් ඒ වියුක්ත චින්තනය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තරමට වියුක්ත නො වී ය. අප කලින් ද සඳහන් කර ඇති අන්දමට වියුක්ත චින්තනයෙහි වඩාත්ම දක්ෂකම් දක්වන්නෝ යුදෙව් ජනවාර්ගිකයෝ ය. ඉනුදු නැගෙනහිර යුරෝපීය යුදෙව් ජනවාර්ගිකයෝ ය. බටහිර ගණිතයෙහි හා සෛද්ධාන්තික භෞතික විද්‍යාවෙහි වඩාත්ම දක්ෂකම් දක්වන්නෝ ද ඔවුහුම වෙති. ප්‍රාග් වෛදික අනාර්යයන් බටහිර ගණිතයෙහි හා සෛද්ධාන්තික භෞතික විද්‍යාවෙහි එතරම් දස්කම් දක්වන බවක් නො පෙනෙයි.

අප සිතන ආකාරයට වියුක්ත චින්තනය ආධිපත්‍යයහි ලා බල පා ඇත්තේ ජනවාර්ගික පදනමකින්, එනම් සංස්කෘතික පදනමකින් පමණක් නො වෙයි. පුරුෂාධිපත්‍යය පිහිටුවීමෙහි ලා ද වියුක්ත චින්තනය යම් බලපෑමක් කර ඇත. ඇතැම් කාන්තාවන් පුරුෂාධිපත්‍යවාදී ප්‍රකාශයක් ලෙස සැලකීමට ඉඩ තිබුණ ද, එකම සංස්කෘතියක පිරිමි සාමාන්‍යයෙන් ගැහැණුන්ට  වඩා වියුක්ත චින්තනයෙහි දක්ෂයෝ වෙති. එකම සංස්කෘතියක වුව ද සමස්තයක් ලෙස ගත්කල පිරිමින් හා ගැහැණුන් සිතන ආකාරය වෙනස් ය. මේ ප්‍රකාශය ද වියුක්ත ප්‍රකාශයක් බව අමතක නොකළ යුතු ය. සමස්තයක් ලෙස ගත්කල යන්නෙන් අදහස් කරන්නේ සාධාරණ වශයෙන් ගත්කල ඇති වියුක්ත පිරිමියකු හෝ ගැහැණියක හෝ ය. ඉතා ඈත කාලයෙහි සමාජයෙහි පුරුෂාධිපත්‍යයක් හෝ කාන්තාධිපත්‍යයක් හෝ තිබිණි යැයි කිව නො හැකි ය. ඇතැම් සමාජ විද්‍යාඥයන් හා පුරා විද්‍යාඥයන් පැරණි  සමාජය මාතෘ මූලික සමාජයක් බව පවසන බව සැබෑ ය. එයට හේතුව පැරණි සමාජයෙහි මාතෘ වන්දනාව තිබූ බවට සාක්ෂි තිබීම ය. එහෙත් එපමණකින් පැරණි සමාජයෙහි කාන්තාධිපත්‍යයක් තිබූ බව කිව නො හැකි ය.

පිරිමි ඒ ඒ සංස්කෘතියෙහි වියුක්ත චින්තනයෙහි දක්ෂයන් වීම හේතුවෙන් අනාගතයට කල් ඇතිව සූදානම් වීමේ හැකියාව ලබති. එබැවින් ඔවුන්ට ආධිපත්‍යයක් පිහිටුවීමෙහි ලා එක්තරා ආකාරයක ආයුධයක් ලැබෙයි. ඒ ආයුධයට කාය ශක්තිය ද එකතු වූ කල ආධිපත්‍යයක් පිහිටුවීමට ඉඩකඩ සැපයෙයි. පුරුෂාධිපත්‍යය යනු හුදෙක් කාය ශක්තිය හෝ ආර්ථික හේතූන් හෝ මත ඇති වූවක් නොව චින්තන ආධිපත්‍යයකද ප්‍රතිඵලයක් වෙයි. චින්තන ආධිපත්‍යය ලැබෙන්නේ වියුක්ත චින්තනයට ය. මනුෂ්‍යයන් සම්බන්ධයෙන් ගත්කල් වියුක්ත චින්තනයෙහි වඩා දක්ෂ ලිංගිකයෝ ද ජනවාර්ගිකයෝ ද අනෙක් ලිංගිකයන් හෝ ජනවාර්ගිකයන් හෝ  මත  ආධිපත්‍යයක් පිහිටුවීමේ හැකියාව ඇත්තෝ වෙති.

© Prof. Nalin De Silva

මෙයින් අදහස් කරන්නේ වෙනත් කිසිවක් නොමැතිව වියුක්ත චින්තනය වැඩියෙන් තිබූ පමණින් යම් පිරිසකට වියුක්ත චින්තනයෙන් අඩු පිරිසක් මත ආධිපත්‍යය පිහිටුවීමෙහි හැකියාව ලැබෙන බව නො වෙයි. පුද්ගලයන් පුද්ගලයන් සම්බන්ධයෙන් ගත්කල මේ කරුණ වඩා පැහැදිලිව තේරුම් ගත හැකි ය. වියුක්ත චින්තනයෙන් වඩා පොහොසත් අයකුට වියුක්ත චින්තනය එතරම් නැති අයකුට වඩා කල් ඇතිව යමක් දැකීමේ සැලසුම් කිරීමේ හැකියාව ලැබෙයි. ඇතැම් විට කාය ශක්තියෙන් අඩු වුව ද වියුක්ත චින්තනයෙන් වඩා පොහොසත් අයකුට අනෙකකු පරාජය කිරීමේ හැකියාව ලැබෙයි. ඒහෙත් කාය ශක්තියෙන් වැඩි තැනැත්තා හුදු කාය ශක්තිය මැනීමේ සටනක දී ජය ලබන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. සමාජයෙහි තාක්‍ෂණික දැනුම වැඩිවත් ම කාය ශක්තියෙහි බලපෑම අඩුවන අතර සැලසුම් කිරීමේ හැකියාව ඇත්තාට තරගයෙහි ජය ලැබෙයි.

සැලසුම් කිරීම යනු වියුක්ත චින්තනයෙහි ප්‍රතිඵලයක් වෙයි. සැලසුම් කිරීම සඳහා බොහෝ දේ සිතෙහි මවාගෙන කටයුතු කිරීමට සිදු වෙයි. කුඩා කටයුත්තක දී පවා සැලසුම් කිරීමට හැකියාව ලැබෙන්නේ ඒ ඒ දේ සිතෙහි මවාගත හැකි නම් පමණකි. පාසලෙහි විද්‍යා දිනය හෝ වෙනත් කටයුත්තක් සංවිධානය කිරීමේ දී කල් ඇතිව සිදුවන දේ ගැන අවබෝධයකින් යුක්තව කටයුතු කිරීමට සිදුවෙයි. න්‍යාය පත්‍රයක් සකස්කර ගැනීමට සිදුවෙයි. වර්තමානයෙහි දී යමක් සිදුවන විට ඒ දැක ගැනීමට වඩා කල් ඇතිව ඒ පිළිබඳ සිතෙන් මෙනෙහි කරමින් කටයුතු කිරීම අමාරු ය. එතරම් සංකීර්ණ නොවන කටයුත්තක දී ද එවැනි අපහසුතා ඇති වේ නම් සාමාන්‍ය අයකුට වියුක්ත සංකල්ප ඔස්සේ සැලසුම් කිරීම අසීරු කටයුත්තක් බව  අවබෝධ වනු ඇත.

මේ සියළු කරුණුවලින් පෙනී යන්නේ වියුක්ත චින්තනයෙහි ශක්තිය ය. වියුක්ත චින්තනයෙන් පොහොසත් තැනැත්තා, ලිංගිකයෝ හෝ ජනවර්ගය හෝ අනෙක් අයට වඩා ආධිපත්‍යය සම්බන්ධයෙන් ගත්කල ඉදිරියෙන් සිටිති. බටහිරයන් අද අනෙක් ජාතීන් හා ජනවර්ග පාලනය කරන්නේ ඔවුන් අනෙක් අයට වඩා වියුක්ත චින්තනයෙන් ඉදිරියෙන් සිටින බැවිනි. අද කාය ශක්තිය හෝ කාය ශක්තිය බහුල වශයෙන් යොදා ගැනෙන ආයුධ හෝ යුද්ධවල දී එතරම් වැදගත් තැනක් නො ගනියි. වර්තමානයෙහි බෙහෙවින් බලපාන්නේ සැලසුම් සහගත ව කෙරෙන යුද මෙහෙයුම් ය. ලංකාවේ කොටි පරාජය කිරීමෙහි ලා ද මේ කරුණ වැදගත් වෙයි.  එහි දී බටහිර රටවල බලපෑම ද සාධකයක් වන බව අමුතුවෙන් කදවයුතු නො වෙයි.

වියුක්ත චින්තනයෙහි වැදගත්කම මේ සියළු කරුණුවලින් පෙනී යනු ඇත. ශාස්ත්‍රිය වශයෙන් ගත්කල බටහිර හෝ වේවා පෙරදිග හෝ වේවා ගණිතයෙහි දී වියුක්ත චින්තනය වැදගත් වෙයි. ගණිතය ට පසුව වියුක්ත චින්තනය වැදගත් වන්නේ සෛද්ධාන්තික භෞතික විද්‍යාවෙහි ය. අප ඉතිහාසයෙහි දකින කරුණක් නම් යම් ආකාරයක වියුක්ත චින්තනයක් තිබූ රටවල යම් ගණිතයක් හා සෛද්ධාන්තික භෞතික විද්‍යාවක් නිර්මාණය වූ බව ය. වෛදිකයන්ගේ භාරතයෙහි ගණිතයක් විය. ඒ ගණිතයෙහි ග්‍රීකයන්ගේ ජ්‍යාමිතිය නැති වූ වාට  වීජ ගණිතයක් හා ත්‍රිකෝණමිතියක් විය. අද ලංකාවේ උසස් පෙළ පරීක්‍ෂණයට නියමිත සංයුක්ත ගණිතය විෂයට නිර්දේශ කර ඇති දැනුමෙන් බොහොමයක් අවුරුදු එක්දහස් දෙසීයකට පමණ ඉහත වෛදික බ්‍රාහ්මණයෝ දැන සිටියහ.

ලෝකයේ මෙතෙක් පහළ වූ ශ්‍රෙෂ්ඨතම ගණිතඥයා/භෞතික විද්‍යාඥයා යැයි බඹටහිර විද්‍යාඥයන විසින් සැලකෙන ආකිමිඩීස් විද්වතා පවා උඩුකුරු තෙරපුම නම් සංසිද්ධිය රූපිකව ඉදිරිපත් කිරීමේ දී පැරණි, එනම් ඊනියා ප්‍රාග් නූතන බටහිර සංස්කෘතියෙහි වැදගත් ස්ථානයක් ගත් වියුක්ත චින්තනයෙහි පිහිට ලැබුවාට සැකයක් නැත. ආකිමිඩීස් විද්වතාට භාර දී තිබුණේ රජ්ජුරුවන්ගේ ඔටුන්නේ තිබූ රත්රන් ප්‍රමාණය  රජු හෝ භාණ්ඩාගාරය හෝ රන්කරුවාට දී තිබූ රත්රන් ප්‍රමාණයට වඩා අඩු දැයි දැනගැනීමට ය.

ආකිමිඩීස් විද්වතාට එහි දී  රජුගේ ඔටුන්න අතපත ගෑමේ නිදහසක් තිබුණි යැයි සිතිය නො හැකි ය. එමෙන් ම ඔහුට කටයුතු කිරීමට සිදු වූයේ පොදුවේ ගත්කල රත්රන් සමග මිස ඔටුන්නේ තිබූ රත්රන් සමග නො වෙයි. වෙනත් ආකාරයකින් කිවහොත් ආකිමිඩීස් විද්වතාට කටයුතු කිරීමට සිදුවූයේ වියුක්ත රත්රන් සමග ය. වියුක්ත රත්රන් සමග කටයුතු කළ ආකිමිඩීස් විද්වතා නිකමට හෝ රත්රන් අතපත නො ගෑවේ ය.

© Prof. Nalin De Silva

වියුක්ත රත්රන් සමග කටයුතු කළ ආකිමිඩීස් විද්වතා එතැනිනුත් එහාට ගියේ ය. ඔහු රත්රන් යන්න ද පසෙකට ලා වියුක්ත වස්තූන් සමග කටයුතු කෙළේ ය. රත්රන් වේවා වෙනත් ඝන ද්‍රව්‍යයක් වේවා ද්‍රවයක ගිළුණු කළ යම් ද්‍රව ප්‍රමාණයක් විස්ථාපනය වන බව ඔහු සිතින් දුටුවේ ය. එහි දී ඔහුට නාන තටාකයේ අත්දැකීම වැදගත් වූවාට සැකයක් නැත. එහෙත් ඔහු නාන තටාකයෙන් ද ඔහුගේ සිරුරෙන් ද ඉවත්විය. සිරුර නාන තටාකයේ ජලයෙහි ගිල්ලවූ කල සිදුවන ක්‍රියාව ඕනෑම ඝන වස්තුවක් ඕනෑම ද්‍රවයක ගිල් වූ කල සිදුවන බව ඔහු තේරුම් ගත්තේ ය. සංයුක්ත අත්දැකීමක් වූ නාන තටාකයේ සිද්ධිය ඕනෑම ඝන වස්තුවකට හා ඕනෑම ද්‍රවයකට වලංගු වන බව ආකිමිඩීස් විද්වතා විසින් තේරුම් ගනු ලැබීම මේ ක්‍රියාවලියෙහි වදෙගත් ම පුරුක වෙයි.

එලෙස සංයුක්තය වියුක්තයක් බවට පත්කර නොගන්නට ආකිමිඩීස් විද්වතාට නාන තටාකය හා තම සිරුර හා සම්බන්ධ සංසිද්ධියකින් ඔටුන්නේ රත්රන්වලට යෑමට නොහැකි වනු ඇත. ඉන් පසු ආකිමිඩීස් විද්වතාට තිබුණේ ඝනත්වය හෝ විශිෂ්ට ගුරුත්වය හෝ නම් සංකල්ප නිර්මාණය කිරීම ය. රත්රන්වල විශිෂ්ට ගුරුත්වය රත්රන්වල හැඩය අනුව වෙනස්වන්නක් නොවන බව ආකිමිඩීස් විද්වතා මේ වන විට තේරුම් ගෙන අවසාන ය.

ආකිමිඩීස් විද්වතාට ඉන්පසු කිරීමට ඉතිරි වී තිබුණේ ඔටුන්නේ විශිෂ්ට ගුරුත්වය රත්රන්වල විශිෂ්ට ගුරුත්වයට සමාන දැයි සෙවීම පමණකි. එය අපහසුවක් නැතිව ම කළහැකි වූවකි. මේ නිදර්ශනයෙන් පෙන්නුම් කරන්නේ වියුක්ත චින්තනයෙහි ශක්තිය ය. ආකිමිඩීස් විද්වතාට ඒ ලැබුණේ පැරණි ග්‍රීක සංස්කෘතියෙනි. යුදෙව්වන් තරමට ම වියුක්ත චින්තනයෙහි දක්ෂයන් නොවුව ද ග්‍රීකයෝ ඒ වන විට වියුක්ත ජ්‍යාමිතියක් ගොඩනගා තිබුහ. පළළක් ඝනකමක් නැති සරල රේඛා නිර්මාණය වූ සංස්කෘතියෙන් ම වස්තුවක විශිෂ්ට ගුරුත්වය යන සංකල්පය ද නිර්මාණය විය.

මහාචාර්ය නලින් ද සිල්වා

© Prof. Nalin De Silva